# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2039/28 - 2017 ඔක්තෝබර් මස 04 වැනි බදාදා - 2017.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2011 (ii)

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

86 වන වගන්තිය යටතේ නියමය

2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 86 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ජාතික මහා මාර්ගයක් ලෙස නම් කර ඇති පිළියන්දල අතුරු මාර්ගයට එකී පනතේ 8 වන වගන්තිය යටතේ 2014 නොවැම්බර් මස 14 වන දින අංක 1888/48 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති නියමය මගින් නිශ්චිත ලෙස සඳහන් කර ඇති ප්‍රවේශ ස්ථානයන්ගෙන් හැර අලුතින් වෙනත් ප්‍රවේශ මාර්ගයන් එකී මහාමාර්ගයට සම්බන්ධ කිරීම සහ හෝ මහජනතාව එකී අතුරු මාර්ගයට වෙනත් ස්ථානවලින් ඇතුල්වීම සහ එකී අතුරු මාර්ගයෙන් පිටවීම, පහත සඳහන් කරනු ලබන හේතූන් මත මේ නියමය මගින් මෙයින් සීමා කරනු ලැබේ ඃ

(1) මෙම අතුරු මාර්ගය දෙපස පිහිටි කුඹුරු සහ පහත් බිම් ගොඩ කිරීම වැළැක්වීම සඳහා ;

සහ

(2) අනවසර ප්‍රවේශයන් සම්බන්ධ කිරීම තුළින් පිළියන්දල අතුරු මාර්ගයෙහි ඵලදායිතාව අඩු වීම වැළැක්වීම සඳහා,

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 ඔක්තෝබර් මස 02 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

10 - 616

1A - PG 3715 — 107 (2017/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*